සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2013 වර්ෂයට අදාල හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ නාමාවලිය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,888 - 2014 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා - 2014.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 990 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 991 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.-* ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත 2014 ඔක්තෝබර් මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 නොවැම්බර් මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 නොවැම්බර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

989 – B 080889—300 (2014/10)
A 1-

# රජයේ නිවේදන

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධි විධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තර* | *පිහිටීම* | *දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද* |
|---|---|---|---|---|---|
| 1451 | 2014.09.17 | ශාන්ත අන්තෝනි කතෝලික දේවස්ථානය | දකුණු කඩවත වෙන්නප්පුව | ගරු බෙනට් ශාන්ත ප්‍රනාන්දු පියතුමා | රෝමානු කතෝලික |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ඔක්තෝබර් මස 16 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක : 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

11-79/1

---

### ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංකය : 1451

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| *විස්තර* | *පිහිටීම* | | *දිස්ත්‍රික්කය* | *දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියා පදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද* |
|---|---|---|---|---|---|
| | *ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය* | *පත්තුව කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය* | | | |
| ශාන්ත අන්තෝනි කතෝලික දේවස්ථානය | දකුණු කඩවත වෙන්නප්පුව | දකුණු පිටිගල් කෝරලය | පුත්තලම | ගරු බෙනට් ශාන්ත ප්‍රනාන්දු පියතුමා | රෝමානු කතෝලික |

වර්ෂ 2014 ක් වූ ඔක්තෝබර් මස 16 වැනි දින බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

ඊ. එම්. ගුණසේතර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

11-79/2

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/61/2014/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.11.07 වැනි දින සිට 2014.11.21 වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කමැති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.11.28 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, එම් දරන කොට්ඨාසයේ 2660 වෙළුමේ 287 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ, නුගේගොඩ පිහිටි "අඹගහවත්ත හෙවත් ගොන්නගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ 1බී දරන කැබැල්ලට එච්. එච්. සුබසිංහ බලයලත් මානකතැන විසින් 2002.08.31 දින මැන සාදන ලද අංක 1975 පිඹුර ප්‍රකාර මායිම්,<br>උතුර : වරිපනම් අංක 72/2 සහ 72/4, කන්දවත්ත පාර,<br>නැගෙනහිර : ලොට් 1ඒ<br>දකුණ : ලොට් 1 සී සහ 1 ඊ<br>බටහිර : අංක 523 පිඹුරේ ලොට් 5<br>ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 6.93 | 01. එස්. ඒ. එම්. ඒ. සී. ජේ. එස්. කේ. සේනාරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2006.09.26 වැනි දින ලියා සහතික කරන ලද අංක 3807 දරන විකුණුම්කරය.<br>02. එස්. ඒ. එම්. ඒ. සී. ජේ. එස්. කේ. සේනාරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2006.09.26 වැනි දින ලියා සහතික කරන අංක 3808 දරන උකස්කරය. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක : 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

11-78

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**මහජන බැංකුව - අවිස්සාවේල්ල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29 D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියන්ති ලියනගේ මහත්මිය විසින් සහතික කරන ලද 2008.08.15 දිනැති අංක 3260 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම, පතිරණගේ ප්‍රියන්ත සුජීව රාජපක්ෂ මයා, අල්ගෙවත්ත දොලාකාර රසිකා ජයලත් මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දොලොස් ලක්ෂ අසූ එක් දහස් දෙසීය පනහක (රු. 12,81,250) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.12.18 වැනි දින සිට වර්ෂයකට සියයට විසි හය බැගින් (26%) හා රුපියල් දොළොස් ලක්ෂ අසූ එක් දහස් දෙසිය පනහක (රු. 12,81,250) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා

අඩුව එකී දොළොස් ලක්ෂ අසූ එක් දහස් දෙසිය පනහක (රු. 12,81,250) මුදලක් අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 3260 දරන උස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝමාගම, හයිලෙවල් පාර, වරිපනම් අංක 198 දරන "ගලවිලවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. විජේසිංහ මහතා විසින් 1997.07.22 වැනි දින මැන සාදන ලද අංක 1115 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් අංක 2 දරන කොටසට මායිම්, උතුරට : අංක 1 දරන කැබැල්ල ද, නැගෙනහිරට : සඟබෝ මාවත (ප්‍රාදේශීය සභා පාර) ද, දකුණට : හයිලෙවල් පාර ද, බස්නාහිරට : ඒ. වයි. විජේරත්න අයිතිවාසිකම් කියන හයිලෙවල් පාර වරිපනම් අංක 200 දරන ගලවිලවත්ත (ඉහත කී අංක 2858 දරන පිඹුරේ අංක 1 දරන කැබැල්ල) ද, යන මෙකී මායිම් තුළ වූ පර්චස් නවයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 9.25) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

මෙම උකස්කරය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 1816/30 හි ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කලාප II.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

11-151

---

## මහජන බැංකුව - අවිස්සාවේල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.29 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස්. අබේරත්න මහත්මිය විසින් 2010.09.14 වැනි දින සහතික කරන ලද උකස් ඔප්පු අංක 2293 සහ එම නීතිඥ හා නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස්. අබේරත්න මහත්මිය විසින් 2010.09.14 දින සහතික කරන ලද අංක 2294 දරන උකස් කිරීමේ ගිවිසුමෙන් ශාඛා කළමනාකාර මහතා වෙත බලය පැවරීම අනුව යන්ත්‍ර සූත්‍ර සඳහා ලබා ගන්නා ලද අංක 1042/2010 හා 2010.09.21 දිනැති උකස්කරය හා ප්‍රසිද්ධ නීතිඥ හා නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස්. අබේරත්න මහත්මිය විසින් 2012.10.15 වැනි දින සහතික කරන ලද උකස් ඔප්පු අංක 4021 දරන උකස්කරයන් ප්‍රකාරව ගෙවීම, සී/ස සබරගමුව තේ (පුද්ගලික) සමාගම යන ආයතනය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී බැඳුම්කරය මත රුපියල් හැටලක්ෂ පනස් දහසක් (රු. 60,50,000) හා රුපියල් හැට නව ලක්ෂයක (රු. 69,00,000) මුදල මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2014.04.21 දින සිට වර්ෂයකට 17% බැගින් රුපියල් හැටලක්ෂ පනස් දහක (රු. 60,50,000) මුදලකට ද, 2014.04.20 දින සිට වර්ෂයකට 11% බැගින් රුපියල් හැට නව ලක්ෂයක (රු. 69,00,000) මුදල් සඳහා වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොළිය සහ අදාළ මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අය කර ගත යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හැට ලක්ෂ පනස් දහසක (රු. 60,50,000) මුදල හා රුපියල් හැට නවලක්ෂයක (රු. 69,00,000) මුදල ද අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 2293, 1042/2010 හා 4021 දරන උකස් බැඳුම්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ද, උපලේඛනයේ සඳහන් යන්ත්‍ර සූත්‍ර ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු බවට, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයිති බටහිර ඇලුගම් කෝරළයේ මාගම්මන ග්‍රාමයෙහි පිහිටි හා මැනුම්පති විසින් සාදවා තමා බාරයේ තබා ඇති කැ. 3725, කැ. 3727 වැනි ක්ෂේත්‍ර පොතෙහි කැ. 3049 වැනි පිඹුරේ 63 වැනි බිම් කට්ටිය වශයෙන් දක්වා ඇති උතුරට : පාර සහ කැබලි අංක 62 ද, නැගෙනහිරට : පාර සහ කැබලි අංක 66 ද, දකුණට : මු. පි. කැ. 3040 හි කැබලි අංක 14, 13 සහ මහා මාර්ගය ද, බස්නාහිරට : මහා මාර්ගය සහ පාර ද යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි දෙකයි හයයි බිංදුවක් (හෙ. 0.2260) ක් විශාල වැරැල්ල වත්ත නමැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඩම් කැබැල්ල වේ.

මෙම උකස්කරයන් අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක දෙහි ප්‍රාලේ 5/9 යටතේ ලියාපදිංචි කර ඇත.

යන්ත්‍ර සූත්‍ර :

01. Electronic weighing scale
02. Manual weighing scale
03. Michi Shifter
04. Indian Trough Jan Units
05. Belt Conveyor
06. Vibratory conveyer
07. Conveyer Control System
08. Including rollers and roll breakers

මෙම උකස්කරය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක වංවල 24/411 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
කොළඹ පිටත.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 177ඒ, හයිලෙවල් පාර,
නුගේගොඩ.

11-153

### මහජන බැංකුව - ලකී ප්ලාසා ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29"ඇ" වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ජූනි මස 26 වැනි දින පැවැති තම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. ප්‍රේමදාස විසින් ලියා සහතික කළ 2014.01.16 දිනැති අංක 1816 දරන උකස් බැඳුම්කරය මත ද 2013.12.18 දිනැති අංක 1796 දරන උකස් බැඳුම්කරය මතද සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. එස්. සමරසිංහ විසින් ලියා සහතික කළ 2009.04.22 දිනැති අංක 8415 දරන උකස් බැඳුම්කරය මත ද අය වීමට ඇති මුදල් ගෙවීම ගුරුන්නාන්සේලාගේ දොන් පාලිත ශ්‍රීලාල් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, අංක 1816, 1796 සහ 8415 දරන එකී උකස් බැඳුම්කර මත රුපියල් විසිපන් මිලියන හත්සිය අසූඑක් දහස් හත්සිය අනූහතරයි ශත විසිනවයක මුදලක් (රු. 25,781,794.29) මහජන බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, අනතුරුව කිසියම් ගෙවීමක් සිදු කර ඇත්නම් එම ගෙවීම අඩු කිරීමෙන් පසුව සහ වෙනත් විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග, (1) රුපියල් මිලියන පහයි හත්සිය දහසක (රු. 57,00,000) ක මුදල ද, 2014.01.11 වැනි දින සිට වාර්ෂික 18% බැගින් පොළිය ද, (2) රුපියල් මිලියන දෙකයි අටසිය දහසක් (රු. 28,00,000) මුදලක් 2014.01.11 වැනි දින සිට වාර්ෂික 18% බැගින් පොළිය ද, සමග (3) රුපියල් මිලියන හයක මුදලක් (රු. 60,00,000) 2013.12.12 වැනි දින සිට 18% බැගින් පොළිය ද, (4) රුපියල් මිලියන දෙකයි පන්සිය දහසක් (රු. 25,00,000) මුදලක් 2013.12.05 වැනි දින සිට වාර්ෂිකව 16% බැගින් පොළිය ද, සමග (5) රුපියල් මිලියන තුනක් (රු. 30,00,000) මුදලක් 2013.12.26 වැනි දින සිට වාර්ෂිකව 18% බැගින් පොළිය ද සමග (6) රුපියල් මිලියන පහක මුදලක් (රු. 50,00,000) 2014.02.12 වැනි දින සිට වාර්ෂිකව 19% බැගින් පොළිය ද සමග සහ (7) රුපියල් හත්ලක්ෂ අසූඑක් දහස් හත්සිය අනූ හතරයි ශත විසිනවයක මුදලක් (රු. 7,81,794.29) 2014.01.24 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වාර්ෂිකව 15% බැගින් පොළිය ද සමග අයකර ගැනීම සඳහා එකී උකස්කළ දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 476 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පන්නල පිහිටි මොහන් ගොඩැල්ල ස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් සකස් කළ 2000.01.11 දිනැති අංක 1737 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොසට ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ සියලුදේම සමග එකී ලොට් 01 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1635 දරන පිඹුරේ ලොට් 60 ද, නැගෙනහිරට : 1635 දරන පිඹුරේ ලොට් 81 ද, දකුණට : අංක 1635 දරන පිඹුරෙහි ලොට් 82 (මීටර් 6ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ බටහිරට : අංක 1635 දරන පිඹුරෙහි ලොට් 92 ද යන මායිම් තුළ පිහිටි අංක 1737 දරන එකී පිඹුරට අනුව පර්චස් විසිහතරයි දශම පනස්දෙකක් (අ. 0, රූ. 0, පර්. 24.52) සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස වන අතර, මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 304/80හි ලියාපදිංචි කර ඇත.

අංක 1635 දරන පිඹුරේ නිරූපිත 81, 9, 3, 83 සහ 99 වශයෙන් ලකුණු කළ කැබලි ද, අංක 1595 දරන පිඹුරේ නිරූපිත 82, 85, 4, 15, 95 වශයෙන් ලකුණු කළ කැබලි ද සහ අංක 1595 දරන පිඹුරේ 22 වශයෙන් ලකුණු කර ඇති කැබැල්ල ද සහ අංක 719 දරන පිඹුරෙහි 22 වශයෙන් ලකුණු කළ කැබැල්ල ද යන කැබලි මතින් වූ මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු,
(කොළඹ - දකුණ).

මහජන බැංකුව,
කළාප ප්‍රධාන කාර්යාලය (බස්නාහිර පළාත - 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

11-152

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2014** | | | | | |
| නොවැම්බර් | 2014.11.07 | සිකුරාදා | 2014.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.11.14 | සිකුරාදා | 2014.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.11.21 | සිකුරාදා | 2014.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.11.28 | සිකුරාදා | 2014.11.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2014.12.05 | සිකුරාදා | 2014.11.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.12 | සිකුරාදා | 2014.11.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.19 | සිකුරාදා | 2014.12.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.26 | සිකුරාදා | 2014.12.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| | **2015** | | | | | |
| ජනවාරි | 2015.01.02 | සිකුරාදා | 2014.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.09 | සිකුරාදා | 2014.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.16 | සිකුරාදා | 2015.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.23 | සිකුරාදා | 2015.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.30 | සිකුරාදා | 2015.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.